**මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| | **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ අංක 3.28 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සඳහා සිදුකළ යුතු ගැලපීම්වල පහත අඩුපාඩු පැවතුණි. | | |
| (i) | ගැලපීම් ලෙස දක්වා තිබූ රු.39,755,084ක් වූ වටිනාකම කුමක්ද යන්න විගණනයට අනාවරණය නොවීය. | 2024 වර්ෂයේ සිට නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.37,122,983ක් වූ ක්ෂය වියදම වෙනුවට රු.43,004,688ක් ගලපා තිබුණි. | -එම- | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂයේ රු.81,679,926ක් වූ පොලී ආදායම වෙනුවට රු.30,000,000ක් පමණක් ගලපා තිබුණි. | -එම- | -එම- |
| (iv) | ලැබියයුතු දැවල වැඩිවීම රු.50,809,972ක් විය යුතු වුවද රු.51,740,408ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (v) | ඉදිරියට ලද වරිපනම් වැඩිවීම ලෙස රු.127,257ක් දක්වා තිබූ නමුත් එවැනි වෙනසක් විගණනයට අනාවරණය නොවීය. | -එම- | -එම- |
| (vi) | ගෙවියයුතු දැවල වැඩිවීම රු.191,054,983ක් විය යුතු වුවද රු.186,052,669ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (vii) | ගෙවියුතු දැවල වෙනස්වීම ගලපා තිබියදී විවිධ ණයහිමි අඩුවීම ලෙස රු.183,478,253ක් ද දක්වා තිබුණි. | 2024 වර්ෂයේ සිට නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.29 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.3 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී පහත අඩුපාඩු පැවතුණි. | | |

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුලදී ආයෝජන නිදහස් කිරීම් රු.45,772,818ක් වුවත් එය රු.1,500,000ක් ලෙස හා රු.13,500,000 ලෙස දක්වා තිබුණි. | 2024 වර්ෂයේ සිට නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.170,000,000 ක් ද ලැබී තිබූ පොලී ආදායම් රු.64,943,496ක් ද දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ඉඩමකට සහ පුස්තකාල පොත්වලට අදාල එකතුව රු.1,324,035ක් දේපල පිරියත අත්පත් කර ගැනීම සඳහා මුදලින් කළ ගෙවීම් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.30 හා එහි පරිශිෂ්ඨය 2 හි පහදාදීම් හා මඟපෙන්වීම්හි EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබූ රු.792,459ක මූල්‍ය පොලී දක්වා නොතිබුණු අතර ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.10,481,642 ක් වුව ද රු.11,404,241 ක් ලෙස දක්වා තිබුණි | -එම- | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී සහා ව්‍යාපෘති වෙනුවෙන් ණයහිමි අධිවෙන්කිරීම් රු.5,894,109ක් සමාලෝචිත වර්ෂයේදී කපාහැරීමේදී අදාල දේපල පිරියත හා උපකරණ අයිතමය බැර කළ යුතු වුවත් සමුච්චිත අරමුදල බැරකර තිබුණි. | 2024 ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම රු.150,994,905ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුල ඉඩම් වෙන්දේසි කිරීමේදී සභාව වෙත ලද ඉඩම් කැබලි දෙකක් ප්‍රාග්ධනිත කර තිබූ අතර එම ඉඩම් කැබලි වෙන්දේසි කිරීමේදී පර්වසයක් සඳහා වූ අවම වටිනාකම මත ඉඩම් දෙකෙහි දල වටිනාකම රු.16,910,000 ක් විය යුතු වුවත් සභාව විසින් රු.1,100,000ක අගයකට තක්සේරු කර ගිණුම්ගත කිරීම නිසා රු.15,810,000කින් ඉඩම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.59,171,479ක් වැඩියෙන් ද ස්ථාවර තැන්පත් ශේෂය රු.106,439,287ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී දේපල පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස රු.11,805,677ක් ලැබී තිබිය දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වර්ෂය තුල ලැබීම් ලෙස රු.171,504,241ක් දක්වා තිබුණි. | 2024 ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුලදී මාර්ග අලුත්වැඩියාවක් සඳහා සභාව වෙත ලැබී තිබුණු රු.992,267ක් හා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු පුනරාවර්ථන ව්‍යාපෘති සඳහා වූ ප්‍රදාන රු.5,000,000ක් ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | අවස්ථා 7කදී දේපල පිරියත හා උපකරණ රු.23,323,399ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛනවල/ ලෙජර් ගිණුම්වල එකතු හා මූල්‍ය ප්‍රකාශවල ගිණුම් 13ක ශේෂයන් අතර රු. 55,370,773 ක්වූ නොසැසඳීම් පැවතුණි. | ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයු විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | පාරවල්,පාලම් හා බෝක්කු | 174,399,205 | උපලේඛන | පිළිතුරු ලබා දී නොමැත. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රදාන ආරම්භක ශේෂය | 177,978,177 | උපලේඛන | -එම- | -එම- |
| (ඇ) | වෙනත් උපකරණ | 4,169,914 | අයිතම වර්ගය | උපලේඛනය යා කර ඇති බව හා ලැයිස්තුව පසුව ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඈ) | ලැබිය යුතු දෑ- වෙනත් | 19,975 | උපලේඛන | 2024 වර්ෂයේදී සුදුසු පරිදි කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | ජල ණයහිමි | 80,825 | උපලේඛන හා කාල විශ්ලේෂණ | -එම- | -එම- |
| (ඊ) | ගබඩා නිකුතු | 51,444,451 | ගබඩා නිකුතු වව්චර්/ ජර්නල් වව්චර් උපලේඛන | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය | මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචන වාර්තාවක් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව. | යොමුගත පනතට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ.104(3) | වාහන අනතුරු 06ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදුකර නොතිබුණි. | ඉදිරියට නියමිත කාලය තුල මූලික පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ii) | මු.රෙ.571 | එකතු වටිනාකම රු.8,079,608 ක් වූ වර්ෂ දෙක ඉක්මවූ ඉකුත් තැන්පතු නියාදනය කර නොතිබුණි. | වසර දෙක ඉක්මවූ තැන්පතු සඳහා ලයිස්තු සකස් කර ගිණුමට ඇතුළත් කර ඇති බව. | -එම- |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 | වාහන 10ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පරීක්ෂා සිදු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කරන බව. | -එම- |
| (ඈ) | 2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019(I) දරන පළාත් පාලන චක්‍රලේඛය | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි ආකෘති ප්‍රකාරව සේවක ණය සම්බන්ධව වාර්ෂිකව ණය සීමා අනුමත කරගෙන නොතිබුණි. | 2024 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයෙන් නිවැරදි කර ඇති බව . | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.30,650,742ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 257,692,865 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ | රු. 000’ |
| (i) | වරිපනම් හා බදු | 34,137 | 37,083 | 27,210 | 39,430 | 35,220 | 29,735 | 25,666 | 36,938 |
| (ii) | කුලී | 1,595 | 1,633 | 2,068 | 411 | 1,516 | 1,430 | 1,430 | 603 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 965 | 2,466 | 2,466 | - | 1,110 | 1,180 | 1,180 | - |
| (iv) | වෙනත් ආදායම් | 642 | 537 | 467 | 115 | 1,131 | 220 | 692 | 179 |
| | | 37,339 | 41,719 | 32,211 | 39,956 | 38,977 | 32,565 | 28,968 | 37,720 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මුලු ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 112 ක් බිල් කර තිබුණද මුලු බිල් කළ ආදායමෙන් සියයට 77ක් පමණක් රැස් කර තිබුණු හෙයින් මුලු ආදායම ඇස්තමේන්තු කිරීම තාත්වික නොවීය. | පිළිතුරු ලබා දී නොමැත. | තාත්විකව ඇස්තමේන්තු සකස්කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු බිල්කළ ආදායම, ඇස්තමේන්තුගත ආදායමට වඩා රු.2,946,000ක් වැඩිවී තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 8ක් විය. | සාමාන්‍යයෙන් ඇස්තමේන්තු ගත ආදායටම වඩා බිල් කරන ආදායම වැඩි වේ. නිශ්චිතවම ඇස්තමේන්තු කිරීම අපහසු බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම්වල බිල්කළ ආදායම හා රැස් කළ ආදායම, ඇස්තමේන්තුගත ආදායම හා සැසඳීමේදී බිල්කළ ආදායම රු.105,000කින් ද රැස් කළ ආදායම රු.175,000කින් ද අඩු වී තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් පිළිවෙළින් සියයට 16 ක් හා 27ක අඩු වීමක් විය. | පරීක්ෂා කර බලා පසුව තොරතුරු ඉදිරිපත් කරන බව. | තාත්විකව ඇස්තමේන්තු සකස්කළ යුතුය. |

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | 2000 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ රු.817,127ක අත්තිකාරම් ශේෂ 32ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු සොයා ගැනීමට අපහසු බැවින් ඒ සඳහා වෙනම කමිටුවක් පත් කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා බව. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පැවත එන රු.1,223,202ක ලැබිය යුතු ශේෂ 36ක් අයකර ගෙන නොතිබූ අතර රු.34,979,565ක ගෙවියයුතු ශේෂ 84ක් නිරවුල් කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | -එම- |

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ශ්‍රවනාගාරය සඳහා ගාස්තු අය කිරීම සඳහා 2023 වර්ෂයේදී ගාස්තු ගැසට්කර අයකර තිබූ නමුත් ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මින්මැදුර වෙළඳ කුටි වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ගාස්තු ගැසට්කර තිබුණ ද ඒ සඳහා ගාස්තු තීරණය කිරීම හා පරිපාලනය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පිළියෙල කර සම්මත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | දෛනික වෙළඳ ස්ථාන නියාමනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2023 වර්ෂයේදී ලැබී තිබුණු විගණිත දින වන 2024 ජනවාරි 24 දින වන විටත් නොවිසඳුණු මහජන පැමිණිලි 102ක් පැවතුණි. | පැමිණිලි හැකි උපරිමඅයුරින් නිරාකරණය කිරීමට කටයුතු කරන බව. | නිසි විසඳුම් ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන ගැසට් නිවේදනය අනුව සභාව විසින් පරිසර බලපත්‍ර ලබාදිය යුතු ආයතන හඳුනා ගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ලබාදිය යුතු ආයතන සම්බන්ධ ලැයිස්තුවක් සකස් කර පිළිවෙළින් එම ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණයක් මඟින් ආයතන හඳුනාගත යුතුය. |
| (ආ) | මෝටර් ග්‍රේඩරය හා ජේ.සී.බී.යන්ත්‍රය 2023 වර්ෂය තුළදී කුලියට ලබා දීමෙන් එකතුව රු.495,350ක ආදායමක් ලබා ගෙන තිබුණ ද අනුමැතිය ලබාදීමකින් තොරව සේවාව ලබාදීමෙන් පසු ගාස්තු අයකළ අවස්ථා 03ක් ද පැය 03ක කාලයක් සඳහා ගාස්තු අයකර තිබූ අවස්ථාවක් වූ නමුත් එම කාලය තහවුරු කර ගත් ආකාරය ද ධාවන සටහන් නිසි ලෙස සම්පූර්ණ නොකිරීම නිසා අවස්ථා 10 කදී ලැබී තිබුණු රු. 219,600ක ආදායම්වල නිරවද්‍යතාවය හා ඒවා ධාවන සටහන්වල සටහන් කර තිබේද යන්න තහවුරු කර ගැනීමට ද නොහැකි විය. | පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | යන්ත්‍ර කුලියට ලබාදීම සම්බන්ධයෙන් නිවැරදි අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ප්‍රචාරණ දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ගාස්තු අය කළ හැකි ප්‍රචාරණ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි. | ප්‍රචාරක දැන්වීම් සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර හඳුනා ගැනීම සිදු කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණයකින් ගාස්තු අය කළ හැකි දැන්වීම් පුවරු හඳුනා ගත යුතුය. |
| (ඈ) | ප්‍රචාරණ දැන්වීම් ගාස්තු පිළිබඳව සම්මත අතුරු ව්‍යවස්ථාවේ දක්වා තිබූ ගාස්තුවට වඩා 2023 වර්ෂයේ අවස්ථා 06ක දී අඩු අගයක් අය කිරීම සඳහා ගැසට් කර තිබුණි. | පරීක්ෂා කර විගණනය වෙත පසුව තොරතුරු ඉදිරිපත් කරන බව. | අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | උප කාර්යාල විසින් එම බල ප්‍රදේශ තුල පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපනශාලා, නවාතැන්පලවල් මෙන්ම සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොවූ හෝටල්, ආපනශාලා, නවාතැන්පලවල් පිළිබඳ විස්තර ඇතුලත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඒ පිළිබඳව සමීක්ෂණයක් ද සිදු කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට සමීක්ෂණය, ලියාපදිංචිය හා බලපත්‍ර ගාස්තු අයකිරිම සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන යැමට කටයුතු කරන බව. | සමීක්ෂණයන් බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියට පටහැනිව දෙවලපොල හා උඩුගම්පල උප කාර්යාල බල ප්‍රදේශ වලට අයත් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 2කින් වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමකින් හා මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආදායම් තක්සේරුවක් සිදු කිරීමකින් තොරව එම හෝටලවල ආදායම් අනුව බලපත්‍ර ගාස්තුව තීරණය කර සභාව වෙත බලපත්‍ර ගාස්තු ගෙවීමට අවස්ථාව ලබා දී තිබීම නිසා 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එකතුව රු. 509,906ක් පමණක් ලබා ගෙන තිබුණි. | 2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනිමේ දි මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නයිවල පිහිටි පුංචි නයිවලවත්ත පොදු ඉඩම සඳහා ප්‍රවේශ මාර්ගයක් හෝ නොතිබුණු බවත් පෞද්ගලික පාර්ශ්වයේ ඉඩම හා පොදු ඉඩම වෙන්කර හඳුනා ගත හැකි වන පරිදි මායිමක් සොයා ගැනීමට නොහැකි වූයෙන් සභාවට අයිති එම ඉතිරි බිම් කොටස අහිමි වීමේ අවදානමක් පැවතුනි. | තාක්ෂණ නිලධාරි මගින් පරීක්ෂා කර ඉදිරි කටයුතු සිදු කරන බව. | සභාවට අයත් වත්කම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් විගනමුල්ල සුසාන භූමි ඉඩම, නිල්පනාගොඩ දොලේවත්ත බිම් කොටස සහ ද ෆිනැන්ස් සමාගම විසින් වෙන්දේසි කළ ඉඩමෙන් සභාවට ලැබුණු ඉඩම් කොටස විධිමත් අනුමැතියකින් හා ගිවිසුම්ගතවීමකින් තොරව කුලී පදනම මත බාහිර පාර්ශ්වයන්ට පරිහරණයට ලබා දී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය හා 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 හා 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016(i) දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛවල විධිවිධානවලින් තොරව වසර 20 කට අධික කාලයක් පසුවී තිබියදීත් මාබොදල කඩ කාමර 50ක් බදු දීමේදී නව චක්‍රලේඛය ප්‍රකාරව නැවත බදු ගිවිසුම් සංශෝධනය කර ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන ආයතන දේපල අතුරු බදු දීම් සම්බන්ධ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | බදු ගැණුම්කරු සමඟ අත්සන් කළ ගිවිසුමෙහි 34 වන කොන්දේසියට අනුව බදු ගැණුම්කරු විසින් කඩ කාමර හෝ එහි කොටසක් හෝ කිසිම ආකාරයකට වෙනස් කිරීමක්, එකතු කිරීමක් සභාවේ ලිඛිත අවසරයක් නොමැතිව නොකළ යුතු වුවද ඊට පටහැනිව උඩුගම්පොල අංක 07 හා 08 යන කඩ කාමරවල මැද බිත්ති ඉවත් කර තනි කාමරයක් ලෙස පත් කර තිබීම සම්බන්ධයෙන් සභාව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බිත්තිය ඉවත් කර තිබීම මෙම සභාවට කිසිදු ආකාරයකින් ආදායම අඩු වීමට බලපා නැති බව. | බදු දුන් දේපල සම්බන්ධව නිසි ලෙස පසු විපරම් කටයුතු සිදු කළ යුතුය. |
| (ඉ) | 2014 ඔක්තෝබර් 24 දින රු.32,500,000කට මිලදී ගෙන තිබුණු අක්කර 13 රූඩ් 02 පර්චස් 12.7 ක ප්‍රමාණයේ මාබොදල ගෝනමඩේවත්ත නැමති පොල් ඉඩමේ පැවති පොල් ගස් ප්‍රමාණය අංක කිරීමක් සිදුකර තිබුණ ද ඵලදාව ලබාදෙනු ලබන ගස් ප්‍රමාණය ගණනය කිරීමක් හෝ ලබාදී තිබුණු ඵලදාව පිළිබඳව කිසිදු වාර්තා කිරීමක් සිදුකර නොතිබුණු හෙයින් 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලබාගෙන තිබූ රු2,634,302ක ආදායම පිළිබඳ නිවැරදි අධීක්ෂණයක් සිදුකළ බවට හා ආදායම නිවැරදි බවට සෑහීමකට පත්විය නොහැකි විය. | ව්‍යාපෘති වාර්තාව සකස් කරන අවස්ථාවේ බලාපොරොත්තු වූ අයුරින් 2014 වර්ෂයේදී ඵලදාව ලබා ගැනීමට නොහැකි වී ඇති බව. | ඉඩම මිලදී ගැනීමට ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති වාර්තාව අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්යමණ්ඩලයේ ද්විතික මට්ටමේ තනතුරු 2ක පුරප්පාඩු 03ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 6ක පුරප්පාඩු 09ක් ද පවතින බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීමට අනුමැතියට යවා ඇති අතර සියළු බඳවා ගැනීම් නැවත සමාලෝචනය කර දැනුම් දෙන තෙක් තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම් දී ඇති බව. | සභාවේ කාර්යයන් සඳහා බාධාවක් නොවන ලෙස කාර්යමණ්ඩලය මෙහෙයවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 24 දින අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 7/2155හි සඳහන් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 8 පටහැනිව අනුව සභා අරමුදලෙහි ගිණුම් පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර එක් එක් මුදල් වර්ෂයන් සඳහා වන ගිණුම අනුගාමී මුදල් වර්ෂයන්හි පෙබරවාරි 28වන දින හෝ එදිනට පූර්වයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට ක්‍රියාකළ යුතු වුවත් සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති වෙත දින 12 ක ප්‍රමාදයක් සහිතව 2024 මාර්තු 12 දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී නියමිත දිනට ගිණුම ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |